# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2033/10 - 2017 අගෝස්තු මස 22 වැනි අඟහරුවාදා - 2017.08.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (XVI)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වැනි වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලැබූ නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2017 අගෝස්තු මස 17 වැනි දින,

නියමාවලිය

1. මේ නියමාවලිය 2017 අංක 03 දරන මානව සම්පත් අභිවර්ධන ආයතන (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දින සිට එය බලාත්මක වන්නේය.

2. 2006 ජුනි මස 22 වැනි දින අංක 1450/23 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියමාවලිය මඟින් අවසන්වරට සංශෝධිත 1979 දෙසැම්බර් මස 26 වැනි දින අංක 68/10 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ 1979 අංක 11 දරන මානව සම්පත් අභිවර්ධන ආයතන නියමාවලිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 6 වැනි ඡේදයෙහි -

(i) (ඇ) සහ (ඈ) අයිතමයන් ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමයන් ආදේශ කිරීමෙන් ඃ

"(ඇ) විශ්වවිද්‍යාලයේ අනුමතයත්, කොමිෂන් සභාවේ එකඟත්වයත් ඇතිව, අනුමත කරන ලද විවිධ අධ්‍යයන අංශයන්හි ප්‍රදානය කළ යුතු උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා නිශ්චය කිරීම ;

(ඈ) අනුමත කරන ලද විවිධ අධ්‍යයන අංශවල ප්‍රවීණත්වය ලැබූ තැනැත්තන් නිශ්චය කිරීමේ කාර්යය සඳහා විශ්වවිද්‍යාලයේ අනුමතය ඇතිව විභාග පැවැත්වීම සහ ඒ විභාගවලින් සාමාර්ථ්‍යය ලබා විශ්වවිද්‍යාලය විසින් ආයතනය විමසීමෙන් පසු සාදනු ලැබිය හැකි අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි වෙනත් කොන්දේසි සපුරාලීමෙන් උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ප්‍රදානය කිරීමට සුදුසුකම් ලැබූ තැනැත්තන් විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම;'';

(2) එහි 13 වැනි ඡේදයෙහි -

(i) (2) වන අනුඡේදයේ (ඇ) අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :

"අනුමත කරන ලද විවිධ අධ්‍යයන අංශයන්හි ප්‍රදානය කළ යුතු උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ අනෙකුත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා පිළිබඳවත්, හැදෑරිය යුතු අධ්‍යාපන පාඨමාලා, ලැබිය යුතු පුහුණුව, සාමාර්ථ්‍යය ලැබිය යුතු විභාග පිළිබඳවත් එවැනි උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ ශාස්ත්‍රීය විශිෂ්ඨතාවලට සුදුස්සන් වීමේ අභිලාෂය ඇති ශිෂ්‍යයන් විසින් සපුරාලිය යුතු වෙනත් කොන්දේසි පිළිබඳවත්, අදාළ අධ්‍යයන සභාව හෝ සභා විමසීමෙන් පසු විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම;'';

(3) එහි 17 වැනි ඡේදයෙහි -

(i) (2) වන අනුඡේදයේ (උ) අයිතමය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :

"අදාළ අධ්‍යයන ක්ෂේත්‍රයට නියමිත විභාග සමත් වීමෙන් සහ වෙනත් නියමිත කොන්දේසි සපුරාලීමෙන් එම ක්ෂේත්‍රයට අදාළ උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් ඇති තැනැත්තන් කමිටුවට නිර්දේශ කිරීම ;".

09 - 41

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.